## විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2025.12.30
වේලාව :- පෙ.ව. 9.30

## සහභාගිත්වය

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2. ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. ජේ.පී.පද්මසිරි මැතිතුමා
12. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
13. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
14. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
15. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
16. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
17. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
18. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
19. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
20. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
21. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
22. පී.ජී.මල්ලිකා මැතිතුමිය
23. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
26. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
27. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
28. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
29. එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
30. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
31. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
32. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
33. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

## නිලධාරී සහාභාගිත්වය

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

## ආගම සිහිකිරීම

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

නිවාඩු අනුමත කර ගැනීමට නොහැකිවීම නිසා ලයනල් මන්ත්‍රීතුමා සභාවට ඒමට නොහැකි වීම සම්බන්ධව සභාව දැනුවත් කරන ලෙස තමාට පැවසූ බවත් ඊට අදාල ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025 වර්ෂ අවසාන ආයතනයෙහි ගිණුම් කටයුතු වලට අදාල ගෙවීම් හා සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා අවශ්‍ය බැවින් මෙම විශේෂ මහ සභාව කැඳවූ බවත් අද සහ හෙට දෙදින වර්ෂ අවසානය බැවින් ඉතා කාර්ය බහුලත්වයක් පවතින බැවින් කාලය අනවශ්‍ය ලෙස ගත නොකර හැකි ඉක්මනින් සභාව කටයුතු නිම කරගැනීමට සැමගේ සහයෝගය අපේක්ෂා කරන බවද ප්‍රකාශ කරන ලදී.

01. පොදු අරමුදල් 2025 යටතේ මුද්දනාව පන්සල් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වන රු222,297.13 ක මුදල බැද්දවල ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවේ ගැටළුවක් පවතින පවතීද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අද දින පවතින්නේ විශේෂ මහසභාවක් බවත්, නමුත් සාකච්ඡාවට ඉදිරිපත් කර තිබෙන්නේ මහ සභාවකට අයත් විෂයන් බවත් ප්‍රකාශ කළ අතර වර්ෂ අවසානයේ යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි වී එම මුදල් යෙදවිය හැකි ව්‍යාපෘති සම්බන්ධව සාකච්ඡා කිරීමට විශේෂ සභාව කැඳවන්නට ඇතැයි අපේක්ෂා කළ බවත්, නමුත් ඉටු කළ ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කටයුතු සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීමට අද දින කැඳවා ඇති බවත්, නමුත් සභාපතිතුමන් හා ලේකම්තුමන් ඇතුළු කමිටු සාමාජික මන්ත්‍රීන් සිටියදී ගෙවීම් කිරීමට පමණක් අනුමැතියක් මහසභාවෙන් ලබා ගැනීම පිළිබඳව තමාට ගැටළුවක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම ගෙවීම සම්බන්ධව යම්කිසි ගැටළුකාරී තත්ත්වයක් මතුවී අධිභාරයක් පැන් පැන නැගුණහොත් එහි වගකීම සභාපති හැටියට ඔබතුමන් භාරගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමන් මතුකළ ප්‍රශ්නය අගය කරන අතර කාර්යාලීය ගෙවීම් කටයුතු හා වැටුප් සම්බන්ධ ගෙවීම් මුදල් කාරක සභාවට බලය පැවරූ අතර ප්‍රාග්ධන ගෙවීම් කටයුතු සම්බන්ධව සභාපති වශයෙන් තමාගේත්, ලේකම්තුමාගෙත් එකඟත්වය මත එම ගෙවීම් මහසභා අනුමැතිය යටතේ සිදු කිරීම සුදුසු බවට තීරණයකට එළඹි බවත්, ඒ අනුව මෙම ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට සහා අනුමැතිය ලබා ගැනිමට ඉදිරිපත් කළ බවත්,ඊළඟ වසරේ සිට මුදල් කමිටුවටම ගෙවීම් කිරීම අනුමත කිරීමට බලය පැවරීමට තීරණය කරන බවත් ප්‍රකාශ කරන ලදී. තවද විශේෂ සභාවක් කැඳවා මෙම බිල්පත් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කළේ එම ව්‍යාපෘති සිදු කළ පුද්ගලයින්හට වසර අවසානයේ මුදල් අවශ්‍ය බව දන්වා ඇති බැවින් බවත් ප්‍රකාශ කරන ලදී.අදාළ යෝජනාව පිළිබඳ ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු222,297.13 ක මුදල බැද්දවල ගොවි සංවිධානය වෙත ගෙවීමට අනුමත කිරීම තීරණය විය.

02. අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් 2025 (පොදු අරමුදල් ව්‍යාපෘති) යටතේ බොලගම කනත්ත පාර කැඩීගිය බෝක්කුව අලුත්වැඩියා කිරීම සඳහා වන රු325,445.34 ක මුදල මින්වාන ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු325,445.34 ක මුදල මින්වාන ගොවි සංවිධානය වෙත ගෙවීමට අනුමත කිරීම තීරණය විය.

03. පොදු අරමුදල් 2025 යටතේ හේනේපොල ඊරියගහදෙණිය මාර්ගය බෝක්කු බට යොදා සංවර්ධන කිරිම සඳහා වැඩ වටිනාකම වන රු84,005.73 ක මුදල ජොෂ්ඨ පුරවැසි සංවිධානය හේනේපොල වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු84,005.73 ක මුදල ජොෂ්ඨ පුරවැසි සංවිධානය හේනේපොල වෙත ගෙවීමට අනුමත කිරීම තීරණය විය.

04. 2026 වර්ෂයට මෙම සභාව සතු රඹුක්කන සතිපොළ සභාව විසින් ක්‍රියාත්මක කිරීමට තීරණය වී ඇති බැවින් ඒ සඳහා ගාස්තු අය කිරීමට මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
<u>එක් දිනකට</u>

- අඩි 7*8 කාමරයකට -රු.150.00
- පදික වේදිකාවේ අඩි 10*12 කොටසකට -රු 100.00
- පදික වේදිකාවේ අයකරගත හැකි අවම ගාස්තුව -රු 50.00

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පොළ කාසි එකතු කිරීම සභාව විසින් සිදු කර ගෙන යාමට තීරණය කර ඇති බැවින් එම මුදල් ජනවාරි මස සිට අයකර ගැනීමට අවශ්‍ය බැවින් මෙම යෝජනා සිදු කළ බව ප්‍රකශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**
පදික වේදිකාව ලෙස හඳනාගෙන ඇති ස්ථාන මොනවා දැයි ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
පොළ භූමියට අයත් 10*12 කඩ කාමර නොවන හිස් ඉඩ කඩෙහි අලෙවි කිරීම පදික වෙළඳාම ලෙස හඳුනාගෙන ඇති බවත්, එහිදී ඉටිරෙද්දක් එලාගෙන හෝ වාහනයක තබාගෙන හෝ එදාවේල පිරිමහ ගැනීමට වෙළෙඳාම් කරන පුද්ගලයින් මේ කාණ්ඩයට ගත හැකි බව ප්‍රකාශ කරන ලදී. පදික වේදිකාවේ වෙළෙඳාම් කිරීම තහනම් කිරීමට බලාපොරොත්තු වන බවත්, මේ වසරේදී පොළ භූමිය නවීකරණ කිරීමට අපේක්ෂා කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

රඹුක්කන නගරයේ වෙළඳ ප්‍රජාව සභාවට බලපත්‍ර, වාරිපනම් බදු, කඩ කුලි ආදිය ගෙවාගෙන වෙළෙඳාමේ කටයුතු සිදුකරන බවත්, මෙසේ පදික වේදිකාවේ වෙළඳාම් කිරීම නිසා ඔවුනට අසාධාරණයක් වන බැවින් පදික වේදිකාවේ වෙළඳාම් කිරීම වෙනුවෙන් රු1,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බවට යෝජනාවක් ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

පදික වේදිකාවේ වෙළඳාම් කිරීමට අදාලව මුදල් අය කළ හොත් එවිට එම පුද්ගලයින්ට නීත්‍යානුකූල අයිතියක් හිමිවන බවත්, එම නිසා පදික වේදිකාවේ වෙළඳාම් කිරීම තහනම් කිරීම සුදුසු බවත්, පදික වේදිකාවේ මහජනතාවට ගමන් කිරීම අපහසු බැවින් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී හා සාකච්ඡා කර පදික වේදිකාවේ වෙළඳාම් කිරීම තහනම් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාවේ සඳහන් පදික වේදිකාව යනුවෙන් අදහස් කරන ලද්දේ සතිපොළ භූමියට අදාලව බවත්, ප්‍රධාන මාර්ගයට ආදාළ පදික වේදිකාවේ වෙළඳාම් කිරීමට නීතිමය වශයෙන් අවසරයක් ගත යුතු බවත්, එවිට ඒ සඳහා මුදලක් අය කරන බවත් ප්‍රකාශ කරන ලදී. තවද නගර අලංකරණය උදෙසා යන ගමන් මාර්ගයෙන් පදික වේදිකාවේ වෙළඳාම එකපාරටම ඉවත් කිරීම සුදුසු නොවන බැවින් ක්‍රමක්‍රමයෙන් පියවරෙන් පියවර යෑම සුදුසු බවත්,ඉන් එක් පියවරක් ලෙස සතිපොළ භූමිය ක්‍රමවත් කිරීම යොදාගත් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පදික වේදිකාවේ වෙළඳාම් කිරීම උදෙසා අය කරන මුදල රු50 /= ද රු100/= ද රු150/= ද ගැටලුවක් නොවන බවත්, ගැටලුව වන්නේ පදික වේදිකාවේ වෙළඳාම් කිරීම බවත්, රුක්මන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි නගරයේ හා පොළ භූමියේ ගාස්තු ගෙවාගෙන සිටින වෙළෙන්දන් ආරක්ෂා කිරීම උදෙසා මෙම මුදල රු100/= කිරීම සුදුසු බවත්, නොබෝ දිනකින්ම පදික වේදිකාවේ වෙළඳාම් කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය ද ඒකරාශී කරගෙන තහනම් කිරීමට වැඩ පිළිවෙළකට යාම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. තවද 2026 වර්ෂයේදී නගර අලංකරණය උදෙසා කමිටුවක් පත්කරගෙන නගරයේ වෙළඳාම් කටයුතු සිදුවිය යුතු ආකාරය වාහන ගමනාගමනය හා වාහන නවතා තැබීම පදික වේදිකාව ආදිය ක්‍රමවත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජංගම වෙළෙඳාම සිදුකරන අවස්ථාවකදී ඔවුන්ගෙන් යම් මුදලක් අය කිරීමට සිදු වුවහොත් ඒ සඳහා නීතිමය බලයක් අවශ්‍ය එබැවින් මෙම පදික වේදිකාවේ වෙළඳාම සඳහා රු100/= ගාස්තුවක් අය කිරීම යන්න තබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන විට ගැටළු සහගත තත්ත්වයක් මතුවිය හැකි බවත්, පදික වේදිකාවේ ගමන් ගන්නා මහජනතාව මෙමඟින් අපහසුතාවයට පත්වන බැවින් පදික වේදිකාවේ වෙළඳාම් කිරීම තහනම් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

රඹුක්කන නගරයේ සතිපොළ පවතින්නේ සතියකට දින දෙකක් පමණක් බවත්, ප්‍රධාන මාර්ගයේ පදික වේදිකාවේ වෙළඳාම හා සතිපොළ භූමියේ පදික වෙළෙඳාම යනු අවස්ථා දෙකක් බවත්, සතිපොළ භූමිය ක්‍රමවත් කිරීම උදෙසාත් දිළිඳු වෙළෙඳුන් ආරක්ෂා කිරීම උදෙසාත් මෙම ගත් ක්‍රියාමාර්ගය අගය කරන බවත්, ඒ අනුව රු.50/= ක් අය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

- කඩකාමර
- පදික වේදිකාවයි,
- පදික වෙළෙඳාම්,

ලෙස කොටස් තුනකට මුදල් අය කිරීමට යෝජනා කර ඇති බවත්,ඒ අනුව කඩකාමර, පදික වේදිකාව හා පදික වෙළඳාම යන අවස්ථා තුන හඳුනාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද පදික වේදිකාවේ වෙළෙඳාම් කිරීමට අවස්ථාව ලබා දෙනවාද නැද්ද යන්න පිළිබඳව තීරණයකට පැමිණිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

කෙසේ වෙතත් පදික වේදිකාවේ වෙළෙඳාම මගින් නගරයේ වෙළෙඳුන්ට මෙන්ම පොළ භූමියේ වෙළෙඳුන්ට අසාධාරණයක් වන බවත්, එසේම මහජනතාවටද මාර්ගයේ ගමන් කිරීමට අපහසුතාවයක් පැන නගින බවත්, එම නිසා පදික වේදිකාවේ වෙළෙඳාම් කිරීම පිළිබඳ විධිමත් තීරණයක් ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සතිපොළ භූමියට අදාළ බව නැවතත් ප්‍රකාශ කරන බවත්,එළවළු වෙළෙන්දන් සතිපොළ ගෘහය ඇතුළත සිටින 7*8 ක බිම් ප්‍රමාණයක හිමි කඩහිමියන් ද ඔවුන්ගෙන් රු.150/= ක් ද, පදික වේදිකාවේ පිරිස ලෙස රෙදිපිලි අලෙවි කරන නිශ්චිත ඉඩකඩක් වෙන් කර නොමැති නමුත් පොළභූමියේම සිටින පිරිස වන අතර ඔවුන්ගෙන් රු.100/= ද එම කාණ්ඩ දෙකටම අයත් නොවන ජංගම වෙළෙඳුන් පදික වෙළෙඳුන් ලෙස හඳුනාගෙන ඇති අතර ඔවුන්ගෙන් රු.50/= ක් අය කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

පෙ.ව.10.05 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා සභාවට පැමිණියේය.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පාරිභෝගිකයා ආරක්ෂා කිරීම හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම මන්ත්‍රීවරු හැටියට අපගේ වගකීම බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ජනවාරි මස සිට අදාල මිල ගණන් අයකර ගැනීම ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

05. පොදු අරමුදල් 2025 යටතේ ඊ් දැල්ලවත්ත සිට හරංගහතැන්න හරහා වල්ගම දක්වා මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය සඳහා රු309,736.84 ක මුදලක් සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම් කිරීම යන ප්‍රධාන කාර්යාලයට ද නැතිනම් ගම්වල පවතින ශාඛාවකට ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රධාන කාර්යාලයට බව ප්‍රකාශ කළ අතර අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු309,736.84 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

06. අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් - පොදු අරමුදල් - 2025 යටතේ කූරෙම්පොළ මාර්ගය හා මොට්ටප්පුලිය මාර්ගය යා කෙරෙන වෙල මැදින් ඇති මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරීම සඳහා වන රු224,064.16 ක මුදල කූරෙම්පොළ නිරෝගා වැඩිහිටි සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව පිළිබඳ ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු224,064.16 ක මුදල කූරෙම්පොළ නිරෝගා වැඩිහිටි සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

07. 2025.12.15 දින පැවති මහ සභා තීරණය පරිදි පිහිට වු කමිටුවේ එනම් 2025.12.17 දින පෙ.ව.10.00 රැස් වු කමිටුවේ කමිටු වාර්තාව මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

කමිටු සාමාජිකයන්,

1. ගරු මන්ත්‍රී - ජී.ජී.උපාලි රෝහණ මැතිතුම
2. ගරු මන්ත්‍රී - පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
3. ගරු මන්ත්‍රී - ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
4. ගරු මන්ත්‍රී - වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
5. ගරු මන්ත්‍රී - **එස්.පී.ආර්.ඒ.පියරත්න** මැතිතුමා
6. විෂය නිලධාරි - කේ.වී.රේණුකා දමයන්ති මිය

01.මෙම සභාව සතු පොදු වෙළෙඳපල තුළ පිහිටි මස් කඩ/ මාළුකඩ ටෙන්ඩර් කළ යුතු බවත්,එහිදී යම් ලංසුකරුවෙකු ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූයේ නම් පහත පරිදි ඒ සඳහා අවශ්‍ය පහසුකම් අඩුපාඩු සකසා දෙන බවත් සාකච්ඡා විය.

02.දැනට පොදු වෙළෙඳපල තුළ පිහිටි අංක 38 කුකුළු මස්කඩය හරක් මස් වෙළෙඳාම පිණිස ලබාදීමටත්, එම කඩ කාමරයේ දොර සතිපොළට පිවිසෙන මාර්ගයට විවෘත වන සේ සකසා දෙන බවත්ය.

03.එසේම පොදු වෙළෙඳපෙළෙහි I අදියර යටතේ මේ වන විට වසා දමා ඇති කඩකාමර පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ආදායම් පරීක්ෂකගෙන් ලබාගෙන එම කඩ කාමර හිමියන්ට තමන්ට හිමි කඩ කාමර තුළ වෙළෙඳාම් කටයුතු සිදුකිරීම ආරම්භ කරන ලෙස,ලිඛිතව දන්නා යැවීමත් එසේ නොවන්නේ නම් තවදුරටත් මෙම කඩ කාමර වසා තබන්නේ නම් එම කඩකාමරය නැවත සභාවට පවරා ගන්නා බවත් සාකච්ඡා විය.

04.එසේම ගරු රුක්මන් අනුර පියරත්න මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කර සිටියේ මෙම වෙළෙඳපළ I අදියරේ මෙම කඩකාමර වසා දැමීමට හේතුව අදාළ කඩ හිමියන්ගෙන් තොරතුරු ලබාගන්නා ලෙසය.

05.තවද, එම වසා දමා ඇති කඩකාමරවල ලෑලි දොරවල් පවතින කාමරවල අලුතින් දොරවල් සවිකර දෙන බවටද සාකච්ඡා විය.

06.තවද,මේ වනවිට පොදු වෙළෙඳපළෙහි පවතින වසා දමා ඇති අංක 33,36,31,32,34 කඩ කාමරවල යම් කඩහිමියෙකුට ගබඩා ද්‍රව්‍ය රැස්කර තබා ගැනීමට අවශ්‍ය නම් කුලී පදනම මත ලබාදිය හැකි බවත් යෝජනා කරන ලදී.

කමිටුව මඟින් යෝජනා කරන ලද ඉහත යෝජනා 05 සඳහා සභා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

ලේඛනවල ගබඩා ලෙස සභා දේපළක් නොමැති බැවින් පොදු වෙළඳපොළෙහි පවතින කඩකාමර සම්බන්ධව කමිටු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කළ ආකාරයට එම කඩ ගබඩා ලෙස ලබාදීම පිළිබඳව ගැටලුවක් පවතින බවත්, එම නිසා එම ගබඩා ලෙස දීමට අපේක්ෂා කරන කඩකාමර ද ටෙන්ඩර් පටිපාටියට හෝ අවම ලංසු මුදලට ලබාදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ටෙන්ඩර්කරුවකු මිලදීගත් කඩකාමරයක් විවෘතව තබා ගන්නවා ද ගබඩා ලෙස පවත්වා ගන්නවා ද යන්න පිළිබඳව සභාවක් හැටියට අපට බලපෑම් කළ නොහැකි බවත්, මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා දේපළක් වන බැවින් ඒ සම්බන්ධව පූර්ණ අයිතියක් සභාව සතු වන අතර සබා දේපළ පිළිබඳ තීන්දු තීරණ ගැනීමට සභාවට හිමිකමක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

නගර සංවර්ධන සැලැස්ම අනුව මෙම වෙළඳ සංකීර්ණය කඩා ඉවත් කිරීමට යෝජනා කර තිබෙන නිසා මෙම ගබඩා ලෙස පවතින කඩකාමර ඉවත් කිරීම සම්බන්ධව කටයුතු නොකරන ලෙස ප්‍රකාශ කළ අතර වෙළෙඳ සංකීර්ණය හරහා මාර්ගයක් ඉදිකිරීමට පෙර පැවති රජය විසින් තීරණය කළ බවත්, එය ක්‍රියාත්මක වූවා ද නැද්ද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

වාර්තමානය වන විට සතිපොළ පිටුපසට ගෙනයාමත් සමඟම අල,ළූණු ව්‍යාපාරිකයින්ගේ කඩකාමර ගබඩා ලෙස පවත්වාගෙන යන බවත්, එම කඩකාමර පොළ භූමියට ආසන්න ඒවා ලබාදීම සුදුසු බවත්, මහජනතාව ආකර්ෂණය කර ගත හැකි ව්‍යාපාරික අවස්ථා වෙළඳ සංකීර්ණය තුළට ගෙන ඒමට සභාවක් හැටියට අප මැදිහත් වීම සුදුසු බවත්, කඩකාමර මිලට ගත් පුද්ගලයින්ට ව්‍යාපාරික අවස්ථා නොමැති නම් එම කඩකාමර ඔවුන්ගෙන් ලබාගෙන හෝ ඔවුන් හරහා වෙනත් පුද්ගලයින්ට ලබාදීම මගින් හෝ පාළු ස්වභාවය නැති කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත්, මේ සම්බන්ධ වෙළඳ ප්‍රජාව සමග තමා සාකච්ඡා කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෙළෙඳ සංකීර්ණය හරහා මාර්ගය විවෘත කර පවතින බවත්, වෙළෙඳ සංකීර්ණය පාළු ස්වභාවයක් ඉසිලීම සම්බන්ධව ව්‍යාපාරිකයින් වගකිවයුතු බවත්, මේ වන විට එහි වෙළඳ මාපියාවක් ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදී. තවද රඹුක්කන වෙළඳ ප්‍රජාවට තම වෙළෙඳාම් කටයුතු සිදු කිරීම සම්බන්ධව තාක්ෂණික දැනුම ලබාදීම අප ද සිදුකළ යුත්තේ යැයි ප්‍රශ්න කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

කමිටු නිර්දේශයක් වාද විවාදයට ගැනීම කොතෙක් දුරට සුදුසු දැයි ප්‍රශ්න කළ අතර මහසභාවට කමිටු වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන්නේ තීරණයක් ගැනීමට හෝ අනුමැතිය ලබා ගැනීමට බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම වෙළෙඳ සංකීර්ණ ස්ථානගත කර පැවතියේ සතිපොළ පාදක කරගෙන බවත්, එකල හොඳ වෙළෙඳාමක් පැවැති බවත්, සතිපොළ එම ස්ථානයෙන් ඉවත් කිරීමත් සමඟම වෙළෙඳාම බිඳවැටුණු බවත් ප්‍රකාශ කරන ලදී. තවද පොදු වෙළෙඳපළ සංකීර්ණය හරහා මාර්ගය විවෘත කළ ද එය භාවිතයට ගත හැකි වන්නේ ත්‍රිරෝදරථ හා මෝටර් රථ සඳහා පමණක් බැවින් එය කොතෙක් දුරට සාර්ථක දැයි විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

වෙළෙඳ සංකීර්ණය මැදින් මාර්ගයක් විවෘත කිරීම සම්බන්ධව යෝජනාව පෙර පැවති රජයේ යෝජනාවක් බවත්, එය වර්තමානයේ ක්‍රියාත්මක වූ බවත්, එහි ගැටළු පැවතුණහොත් පසුව ඒ සම්බන්ධව කටයුතු කළ හැකි බවත්, කමිටු පත් කරන විට සෑම පක්ෂයකම නියෝජනය වන සේ සාමාජිකයින් පත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වන නිසා මෙම කාරණය ගැන වාද විවාද කළ බවත්, දැන් පවතින පොළ භූමිය පාදක කරගෙන වෙළඳ සංකීර්ණ නැවත ස්ථාපනය කිරීම සුදුසු බවත්, දේශපාලන මතිමතාන්දර ඉස්මතු නොකළ බවත්, වෙළෙඳ ප්‍රජාව හා පාරිභෝගිකයා ආරක්ෂා කරගෙන ගැනීම උදෙසා කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පක්ෂයක් විදියට ආවට ගියාට තීන්දු තීරණ නොගන්නා බවත්,කමිටුවක් පත් කළේ තීරණයක් ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට බවත්, කමිටු යෝජනාවක් අනවශ්‍ය ලෙස විවාදයට නොගත යුතු බවත්, රඹුක්කන වෙළෙඳ ප්‍රජාවගේ සුබ සිද්ධිය උදෙසා ගත හැකි උපරිම ක්‍රියා මාර්ග ගැනීමට කැපවෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

කමිටු වාර්තාවට වඩා මහසභා තීරණය උත්තරීතර බවත්, කඩ කාමර තෙමෙන බව කමිටු වාර්තාවට ඇතුළත් විය යුතු බවත්, I හා II අදියරේ කඩ කාමර සම්බන්ධයෙන් පවතින ගැටලුව සම්බන්ධව ගත්කළ වසා ඇති කඩකාමර විවෘතව තබා ගැනීමටත්, ගබඩා ලෙස පවතින කඩ කාමර පිටුපසට රැගෙන යාම සම්බන්ධවත් විපක්ෂ මන්ත්‍රීවරුන් වන අපගේ විරුද්ධත්වයක් නොමැති බවත්, නගර සංවර්ධනය උදෙසා සිදුකරන සියලු ක්‍රියාමාර්ගයක්ට තමාගේ විරුද්ධත්වයක් නොමැති බවත්, එයට සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.12.15 දින කමිටු නිර්දේශය,

- මෙම සභාව සතු පොදු වෙළෙඳපල තුළ පිහිටි මස් කඩ/ මාළුකඩ ටෙන්ඩර් කළ යුතු බවත්,එහිදී යම් ලංසුකරුවෙකු ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූයේ නම් පහත පරිදි ඒ සඳහා අවශ්‍ය පහසුකම් අඩුපාඩු සකසා දෙන බවත් සාකච්ඡා විය.

01.දැනට පොදු වෙළෙඳපල තුළ පිහිටි අංක 38 කුකුළු මස්කඩය හරක් මස් වෙළෙඳාම පිණිස ලබාදීමටත්, එම කඩ කාමරයේ දොර සතිපොළට පිවිසෙන මාර්ගයට විවෘත වන සේ සකසා දෙන බවත්ය.

02.එසේම පොදු වෙළෙඳපෙළෙහි I අදියර යටතේ මේ වන විට වසා දමා ඇති කඩකාමර පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ආදායම් පරීක්ෂකතුමාගෙන් ලබාගෙන එම කඩ කාමර හිමියන්ට තමන්ට හිමි කඩ කාමර තුළ වෙළෙඳාම් කටයුතු සිදුකිරීම ආරම්භ කරන ලෙසත්,ලිඛිතව දන්නා යැවීමත් එසේ නොවන්නේ නම් තවදුරටත් මෙම කඩ කාමර වසා තබන්නේ නම් එම කඩකාමරය නැවත සභාවට පවරා ගන්නා බවත් සාකච්ඡා විය.

03.එසේම ගරු රුක්මන් අනුර පියරත්න මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කර සිටියේ මෙම වෙළෙඳපළ I අදියරේ මෙම කඩකාමර වසා දැමීමට හේතුව අදාළ කඩ හිමියන්ගෙන් තොරතුරු ලබාගන්නා ලෙසය.

04.තවද එම වසා දමා ඇති කඩකාමරවල ලෑලි දොරවල් පවතින කාමරවල අලුතින් දොරවල් සවිකර දෙන බවටද සාකච්ඡා විය.

05.තවද මේ වනවිට පොදු වෙළෙඳපළෙහි පවතින වසා දමා ඇති අංක 33,36,31,32,34 කඩ කාමරවල යම් කඩහිමියෙකුට ගබඩා ද්‍රව්‍ය රැස්කර තබා ගැනීමට අවශ්‍ය නම් කුලී පදනම මත ලබාදිය හැකි බව බවත් යෝජනා කරන ලදී.
කුලී පදනම සංශෝධනය විය යුතු බවත්, අවම ලංසුවට ලබාදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ කමිටු නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.12.15 දින පැවති කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

08. 2026 වර්ෂයට බදු පැනවීම සහ ගාස්තු අය කිරිමට අදාළව ගැසට් පත්‍රය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පරිවර්තනය කිරීම වෙනුවෙන් U.S.C.J.කුමාරි මිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කැගල්ල වෙත රු12,177.50 ක මුදලක් සහ M.A.M.ෆවුසර් මයා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කැගල්ල වෙත රු11,415.00

ක මුදලක් ගෙවීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

විපක්ෂ මන්ත්‍රීවරුන් වන අප සභාවට සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ බවත්, එම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට සහ අනුමැතිය ලැබුණ ව්‍යාපෘති තිබූ බවත්, නමුත් එම කිසිම ව්‍යාපෘතියක් මෙතෙක් ක්‍රියාත්මක නොවූ බවත්, එම නිසා විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත්, න්‍යාය පත්‍රයේ සඳහන් පරිදි අංක 01 යෝජනාවේ සිට අංක 17 දක්වා වූ යෝජනා සඳහා විපක්ෂ මන්ත්‍රීවරුන් වන අපගේ විරුද්ධත්වයක් නොමැති බවත්, 18 වෙනි යෝජනාවේ කර්මාන්ත 09 ට අදාළව ගෙවිය යුතු වටිනාකම සඳහන් වී නොමැති බැවින් එම යෝජනාවට විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

සර්වජන බලවේගයේ රඹුක්කන ආසනයේ ආසන සංවිධායක ලෙස 2025 වර්ෂයට අදාළව සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම ඉදිරිපත් කළ බවත්, ඒවා ක්‍රියාත්මක නොවූ බවත්,සභාවට දැන ගැනීම සඳහා ප්‍රකාශ කරන බවත්, 2025.12.31 දිනය හෙට බවත්, ලේකම්වරයා ලෙස කිසිදු ලියවිල්ලකට සොයා බලන්නේ නැතුව අත්සන නොයෙද වන ලෙසත් ප්‍රකාශ කළ අතර සභාපතිතුමන් හට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව බොහෝ මන්ත්‍රීවරුන් පිරිසක් කැමැත්තෙන් සිටි බවත්, නමුත් දැන් එම කැමැත්ත නැති වී ඇති බවත්, දන්වන්නට කැමති බවත්, එය නැවත ඇති කරවා ගැනීමට අවැසි නම් 2026 වර්ෂයේදීවත් සෑම මන්ත්‍රීවරයකුටම යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දෙන ලෙස යෝජනා කරන ලද අතර නව වසරට සුභාසිරි එක් කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

18 වන යෝජනාවට විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සම්බන්ධව කණගාටු වන බවත්, මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා සභා අනුමැතිය ලැබී ඇති බවත්, ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා ඉදිරිපත් කර ඇති බවත්, මෙසේ විරුද්ධත්වය ප්‍රකාශ කළහොත් එය විපක්ෂ මන්ත්‍රීවරුන් හට ප්‍රධාන මරු පහරක් වන බවත්, රඹුක්කන ආසනය පුරා වසම් 89 ක් පවතින බවත්, සෑම වසමකටම සංවර්ධන ව්‍යාපෘතියක් කිරීමට තරම් මුදල් ප්‍රතිපාදන නොතිබූ බවත්, එම වසම් වලින් පැමිණි යෝජනා වලින් ප්‍රමුඛතා ලේඛනය අනුව ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති බවත් පැහැදලි කරන ලදී.

සභා ගර්භයේ ඝෝෂා

සභාපතිතුමන් විසින් එය පාලනය කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

U.S.C.J.කුමාරි මිය,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල වෙත රු12,177.50 ක මුදලක් සහ M.A.M.ෆවුසර් මයා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල වෙත රු11,415.00 ක මුදලක් ගෙවීමට තීරණය විය.

09.2026 වර්ෂය සඳහා මාංශ අලෙවිසැල් සහ ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් විරෝධතා කැඳවීම ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පර්වර්තනය කිරීම වෙනුවෙන් U.S.C.J.කුමාරි මිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල වෙත රු605.00 ක මුදලක් සහ M.A.M.ෆවුසර් මයා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල වෙත රු545.00 ක මුදලක් ගෙවීම සඳහා මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

U.S.C.J.කුමාරි මිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල වෙත රු605.00 ක මුදලක් සහ M.A.M.ෆවුසර් මයා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල වෙත රු545.00 ක මුදලක් ගෙවීමට තීරණය විය.

10. කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ගැටළුකාරී තත්වයන් නිරාකරණය කර ගනිමින් දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් සේවකයින් 06 දෙනෙකු බඳවා ගැනිම සඳහා **2025.10.08** දින ලද සභා අනුමැතිය මත සිදු කරන ලද ටෙන්ඩර් කැඳවීම අනුව මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලයින් අතරින් ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ පරීක්ෂණය අනුව සුදුසුකම් ලැබූ පහත නම් සඳහන් සේවකයන් මාස 03 න් 03 ට සේවය බණ්ඩනය වන පරිදි ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට සේවයේ යොදවා ගැනීමටත්, ඔවුන් වෙත දෛනිකව රු1,500.00 ක දීමනාවක් ගෙවීමටත් මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

| අනු අංකය | නම | සේවයේ යොදවා ගන්නා දිනය |
|---|---|---|
| 01 | ආර්.ඩී.සමන්ත ප්‍රදීප් කුමාර මයා | 2026.01.30 සිට 2026.04.29 දක්වා (පෙර ගිවිසුම් කාලය 2026.01.28 දක්වා පවතින බැවින්) |
| 02. | ඒ.ඩී.ගුණරත්න මයා | 2026.01.30 සිට 2026.04.29 දක්වා (පෙර ගිවිසුම් කාලය 2026.01.28 දක්වා පවතින බැවින්) |
| 03. | එච්.ඒ.නිමල් පියරත්න හෙට්ටිආරච්චි මයා | 2026.01.01 සිට 2026.03.31 දක්වා |
| 04. | එල්.ඒ.ඩී.ප්‍රියංකා මාලනී පෙරේරා මෙය | 2026.01.01 සිට 2026.03.31 දක්වා |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත නම් සඳහන් සේවකයන් මාස 03 න් 03 ට සේවය බණ්ඩනය වන පරිදි ඔවුන්ගේ නමට ඉදිරියෙන් ඇති දිනවල සිට සේවයේ යොදවා ගැනීමටත්,ඔවුන් වෙත දෛනිකව රු1,500.00 ක දීමනාවක් ගෙවීමටත් තීරණය විය.

11. 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා මහ සභා අනුමැති ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

2026 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීමට තීරණය විය.

12. රඹුක්කන ශ්‍රවණාගාර සංකීර්ණයේ පරිපාලන උපදේශන සේවා ගාස්තුව වන රු1,683,035.79 ක මුදලක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරුසේවා) වෙත ගෙවීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රඹුක්කන ශ්‍රවණාගාර සංකීර්ණයේ පරිපාලන උපදේශන සේවා ගාස්තුව වන රු1,683,035.79 ක මුදල නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරුසේවා) වෙත ගෙවීම අනුමත කිරීමට තීරණය විය.

13. සභාව සතු 350 DI ස්ටැන්ඩඩ් මාදිලියේ ට්‍රැක්ටරයේ (RB – 4783) සහ විමල් ට්‍රැක්ටර් ටේලරයේ (RV -8542) වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට රු3,300.00 ක මුදලක් අත්තිකාරම් මුදලක් වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සැ.යු :- මෙම අත්තිකාරම් ලබාගත යුත්තේ 2026 වර්ෂයට අදාළවය.මන්දයත් 2026 ජනවාරි මස 05 සහ 06 යන දිනවල වාර්ෂික ආදායම් බලපත්‍රය අවශ්‍ය වන බැවිනි.
RB – 4783 (ට්‍රැක්ටරය) - රු1200.00
RV – 8542 (ටේලරය) - රු2100.00

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ඉහත වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනිම සඳහා රු3,300.00 ක අත්තිකාරම් මුදල ලබාදීමට තීරණය විය.

14. පොදු අරමුදල් 2025 යටතේ(අත්‍යාවශ්‍ය මහජන ඉල්ලීම්) දබරහේන ඔයට බසින ස්ථානයේ පඩිපෙළ සකස් කිරීම ව්‍යාපෘතියේ බිල්පත් වටිනාකම වන රු352,340.37 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපාකාර සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු352,340.37 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපාකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

15. අත්‍යාවශ්‍ය මහජන ඉල්ලීම් - පොදු අරමුදල් 2025 යටතේ කාඩවට්ටිය වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස හා ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු382,243.35 ක මුදලක් නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු382,243.35 ක මුදල නත්තඹුර වසමේ වැඩිහිටියන්ගේ සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

16. පොදු අරමුදල් - 2025 යටතේ සේනානායක මාවතින් ආරම්භව මොට්ටප්පුලිය වත්ත මාර්ගය ගිලා බැස ඇති ස්ථානයට පැති බැම්මක් ඉදිකිරීම ව්‍යාපෘතියේ මුදල වන රු 1,044,731.44 ක් නිරෝගා වැඩිහිටි සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව පිළිබඳ ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවති ද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු 1,044,731.44 ක මුදල නිරෝගා වැඩිහිටි සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

17. අත්‍යාවශ්‍ය මහජන ඉල්ලීම් - පොදු අරමුදල් 2025 යටතේ ඉටුකළ කොටගම හිරිවඩුන්න ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ආර්.එම් රත්නායක ජයවර්ධන මහතාගේ නිවස අසලින් ආරම්භවන හිටිනාවත්ත පාර සංවර්ධනය කිරීම සඳහා රු246,645.91 මුදලක් දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය - කොටගම වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතී ද යන්න විමසන ලදී.
අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
තීරණය -
රු246,645.91 ක මුදල දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය - කොටගම වෙත ගෙවීමට තීරණය විය.

18. පහත සඳහන් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වලට අදාල ගෙවීම් කිරීමට යෝජනා කරමි.

- i. මොට්ටප්පුලිය බෝධිරාජාරාම මාවත දෙවන පටුමග සංවර්ධනය කිරීම.
- ii. නාබිරිත්ත මූකලාන මාර්ගය සංවර්ධනය කිරීම.
- iii. නවගමුව ආරම්බඩ හාල්පාන කුඹුර පාර (බොරළු පස්/ ගල් පස් යොදා )සංවර්ධනය කිරීම.
- iv. ඊරියාව කරුණාරත්නගම මාර්ගයේ ඉදිකරමින් යන කාණුව සඳහා යකඩ දැල් රාමුවක් සවි කිරිම.
- v. ඉහළගම ප්‍රධාන මාර්ගයේ ගල්වැටි හේන වැරැල්ල දක්වා මාගේ සංවර්ධනය කිරීම.
- vi. කෙසෙල්වතුගොඩ සිට මල්බෙරිවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.
- vii. ගම්වල උතුර වල්පොල පාර සංවර්ධනය කිරීම.
- viii. පලොල්ගහමුල හන්දියේ සිට හල්පිටිය දක්වා යන අතුරු මාර්ග සංවර්ධනය කිරීම.
- ix. මහිපාල හේරත් මාවතේ අබලන්වී ඇති කොටස අලුත්වැඩියා කිරීම.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

18 වන යෝජනාවේ සඳහන් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව රුක්මන් මන්ත්‍රීතුමන් ප්‍රකාශ කළ පරිදි මුළු විපක්ෂයම විරුද්ධ දැයි විමසන ලදී.

සභා ගර්භයේ ඝෝෂා - සභාපතිතුමන් විසින් එය පාලනය කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තමා සභාපති ලෙස පත්වූයේ මහජන ඡන්දයෙන් හා පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආශිර්වාදයෙන් බවත්, තමාට ඉදිරියට කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති රාමුවක් පවතින බවත්, ඒ අනුව කටයුතු කරන බවත්, යකාට බය නම් සොහොනේ ගෙවල් සාදන්නේ නැති බවත්, ලේකම්තුමන් හට තර්ජනය කිරීම මන්ත්‍රීවරුන් වන ඔබතුමන්නාසේලාට නොගැලපෙන බවත්, එසේ සිදුකර අප අතර පවතින සුහදත්වය නැති කිරීමට තරම් කුහක නොවන ලෙසත් විශේෂයෙන්ම රුක්මන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අදහස අනුව 17 දක්වා වූ යෝජනා සම්බන්ධව එකඟත්වය හා 18 වන යෝජනාවේ වටිනාකම සඳහන් නොවීම නිසා විරුද්ධත්වය ප්‍රකාශ කළ බැවිනුත් 18 වන යෝජනාවට අදාළ සංවර්ධන ව්‍යාපෘතිවල වටිනාකම් සමඟ ඊළඟ සභා වාරයේදී ඉදිරිපත් කිරීමට සූදානම් බවත් ප්‍රකාශ කරමින් 18 වන යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව 11.00 ට පමණ අවසන් කරන ලදී.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.